**<u>ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය -2012</u>**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) විද්‍යාලයට අයත් නොවන වාහන, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරිම**

(i) විද්‍යාලය මගින් පරිහරණය කෙරෙන , එහෙත් ආරක්ෂක අමාත්‍යාංශයට හා යුධ හමුදාවට අයත් එකතුව රු.51,321,500 ක පිරිවැය වූ වාහන, මාණ්ඩලික විද්‍යාලයේ ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීම නිසා එම වත්කම් හා සමුච්චිත අරමුදල රු. 51,321,500 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) හිමිකමක් නැති වාහනවල ක්ෂය, ගිණුම්වලට ගැලපීම නිසා ක්ෂය වෙන් කිරීම් රු.23,712,900 ක් වැඩියෙන් දක්වා තිබූ අතර සමුච්චිත අරමුදල රු.13,448,600 ක් අඩුවෙන්ද වර්ෂයේ අලාභය රු.10,264,300 ක් වැඩියෙන්ද දක්වා තිබුණි.

(iii) විද්‍යාලය මගින් පරිහරණය කෙරෙන එහෙත් යුධ හමුදාවට අයත් වාහන අපහරණය කිරීමේදී සිදුවූ රු.2,160,000 ක අලාභය ගිණුම්වලට ගැලපීම නිසා

සමාලෝචිත වර්ෂයට අදාල අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) **තැන්පතු ගිණුම**

කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රඳවුම් මුදල් හා කාර්ය මණ්ඩල වැටුප් රහිත නිවාඩු වලට අදාලව කරන ලද අඩුකිරීම් ජංගම නොවන වගකීම් යටතේ තැන්පතු ගිණුමට බැරකර තිබුණි. 2010 පෙබරවාරි මස සිට 2012 ජනවාරි මස දක්වා වැටුප් රහිත නිවාඩු වශයෙන් අඩුකර තිබූ රු.340,628 ක් ඉහත තැන්පතු ගිණුමට බැර කිරීම නිසා ජංගම නොවන වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

1.2.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8 (1) වගන්තිය | සෑම මුදල් වර්ෂයක් සඳහාම අයවැය ලේඛනයක් පිළියෙල කොට අදාල මුදල් වර්ෂය ආරම්භ වීමට මාස තුනකට පෙර පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුවත් 2012 වර්ෂයේ අයවැය ලේඛනය 2013 පෙබරවාරි 27 දින අනුමත කර තිබුණි. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනයේ අයවැයගත ශේෂපත්‍රය, අයවැයගත ආදායම් සහ වියදම් ප්‍රකාශය හා අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඇතුළත් කර නොතිබුණි. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම්වලින් ජනනය වූ මූල්‍ය ප්‍රතිඵලය රු.6,410,036 ක ඌනතාවයක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,017,213 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,392,823 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,392,823 ක පිරිහීම සඳහා පසුගිය වර්ෂයට සාපේක්ෂව සමහර වියදම් රු.22,844,365 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

මාණ්ඩලික විද්‍යාලය විසින් මෙහෙයවනු ලබන උපාධි පාඨමාලාවට සමාලෝචිත වර්ෂයේ සහභාගි වූ සිසුන් සංඛ්‍යාව 102 ක් වූ අතර ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේ සහභාගී වූ සිසුන් සංඛ්‍යාව 83 ක් විය. විස්තීරණ ආදායම් ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ මුළු වියදම රු.145,076,708 ක්වූ අතර ඒ අනුව එක් උපාධිධාරියෙකු වෙනුවෙන් රු.1,422,321 ක පිරිවැයක් දරා තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ගබඩා භාණ්ඩ පරීක්ෂාව**

(i) තොග පොත් ගබඩාවෙන් පිටස්තරව පවත්වා නොතිබුණු නිසා 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා තිබූ තොග ශේෂයේ නිරවද්‍යතාවය තහවුරු කළ නොහැකි විය.

(ii) විද්‍යාලයේ එක් එක් අංශවල භාවිතයට ගන්නා වත්කම් පිළිබඳ විස්තර ඇතුළත් කිරීම සඳහා වෙනම ඉන්වෙන්ට්‍රි ලේඛන නඩත්තු කර නොතිබුණි.

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේදී ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 64 ක් ලෙස නිශ්චය කරමින් විද්‍යාලයේ සිව්මහල් සින්ඩිකේට් ගොඩනැගිල්ල නාවික හමුදාවේ අධීක්ෂණය යටතේ බාහිර කොන්ත්‍රාත්කරුවෙකු ලවා ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඉන් රු.මිලියන 46.2 ක ප්‍රතිපාදන 2011 වසරේ නාවික හමුදාවට ලබා දී තිබුණද, වැය කර තිබුණේ රු.මිලියන 4.2 ක් පමණි. 2011 වර්ෂය අවසානයේදී රු.මිලියන 42 ක් නැවත භාණ්ඩාගාරයට බැර කර තිබුණි.

(ආ) 2012 වර්ෂයේදීද විද්‍යාලයේ ප්‍රතිපාදනවලින් රු.මිලියන 17.8 ක් මෙම ඉදිකිරීම වෙනුවෙන් ලබාදී තිබුණි. එහෙත් එම වර්ෂය අවසාන වන විටත් ඉදිකිරීම් කටයුතු නිමවී නොතිබූ අතර මිළගණන් වැඩිවීම හා කාලප්‍රමාදය නිසා මුල් ඇස්තමේන්තුව රු.මිලියන 86.5 දක්වා වැඩිකර තිබුණි. තවද ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම නිසා 2013 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිත පාඨමාලා අපේක්ෂිත මට්ටමින් පුළුල් කළ නොහැකි වී තිබුණි.

3.4 **අරමුදල් ඌන උපයෝජනය**

වාර්ෂිකව මහා භාණ්ඩාගාරය විසින් ලබාදුන් ප්‍රාග්ධන ප්‍රතිපාදන විද්‍යාලය මගින් උපයෝජනය කර නොගැනීම හේතුවෙන් වර්ෂ අවසානයේ නැවත භාණ්ඩාගාරය වෙත බැරවීම අඛණ්ඩව සිදුවී තිබුණි. එලෙස 2010, 2011 හා 2012 වර්ෂ අවසානයේදී පිළිවෙලින් රු.මිලියන 27.2 ක්, රු.මිලියන 55.7 ක් හා රු.මිලියන 16.8 ක් ප්‍රයෝජනයට නොගෙන භාණ්ඩාගාරයට බැර කර තිබුණි.

3.5 **වාහන උපයෝජනය**

විද්‍යාලය සඳහා ආරක්ෂක අමාත්‍යාංශය මගින් වාහන 17 ක් හා යුද්ධ හමුදාව මගින් වාහන 14 ක් ලබා දී තිබූ අතර මෙම වාහනවල අයිතිය විද්‍යාලය වෙත පවරා නොතිබුණි. ත්‍රීවිල් රථයක් 2011 දෙසැම්බර් 17 දින සිට ගර්හිතව නිකරුනේ ගාල්කර තිබුණි. විද්‍යාලය භාවිතා

කරන වාහන එකම අංශයකින් පාලනය කළයුතු වුවත් යුද්ධ හමුදාව හා ආරක්ෂක අමාත්‍යාංශයේ වාහන ප්‍රවාහන අංශයෙන්ද ගුවන් හමුදාව මගින් සැපයූ වාහන 04 ක් හා නාවික හමුදාව මගින් සැපයූ වාහන 02 ක් ඔවුන්ගේ ඒකක (Wing) මගින්ද පාලනය වන පරිදි පාලන කටයුතු විමධ්‍යගත කර තිබුණි.

3.6 **සේවක මණ්ඩල කළමනාකරණය**

විද්‍යාලයේ අනුමත සේවක සංඛ්‍යාව 100 ක් වුවද සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 92 ක් විය.

4. **ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය**

4.1 **වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

2012 වර්ෂයට අදාලව විද්‍යාලයේ පුනරාවර්තන වියදම් සඳහා රු.103,000,000 ක හා ප්‍රාග්ධන වියදම් සඳහා රු.200,000,000 ක ප්‍රතිපාදන ලැබී තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී එයින් පුනරාවර්තන වියදම් ලෙස රු.109,691,297 ක්ද ප්‍රාග්ධන වියදම් ලෙස රු.146,473,933 ක්ද වැය කර තිබුණි. මේ පිළිබඳ මූල්‍ය ඉලක්කයන් හා භෞතික ඉලක්කයන් ඒ ඒ කාලවකවානු අනුව හඳුනාගත හැකි වන පරිදි ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි. ක්‍රියාකාරි සැලැස්ම සමග සංසන්දනය කළ හැකි වන පරිදි කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

4.2 **අයවැය ලේඛනමය පාලනය**

ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර සැලකිය යුතු විචලනයක් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.3 **වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.3 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂයක් අවසාන වී දින 150 ක් ඇතුළත ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව හා ගිණුම් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු

වුවත්, 2010 හා 2011 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා 2013 නොවැම්බර් 9 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

5. **පද්ධති හා පාලනයන්**

**---------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සභාපතිවරයා වෙත වරින් වර දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ප්‍රාග්ධන ප්‍රතිපාදන උපයෝජනය

(ආ) සේවක මණ්ඩල පාලනය

(ඇ) ඉදිකිරීම් කටයුතු

(ඈ) ගබඩා පාලනය